

# තාරකා

## රසික ජයකොඩි

ඉතා දිග දවසක අවසන
ඉබාගාතේ ගිය මේ කුළක්
කළුවරේ විත් වාඩි වෙනකොට
අත තබා
ඉහ ඉද්දර මුදුන් වෙන
නිවි නිවී දිලෙන හිනැහෙන
දිග සිහිනයක කෙටි නම
තාරකා..

කාටවත් නොපෙනෙන්න වකුටුව
ඇහැ පියාගත් විට දෙදණ මත
හිස තබා
ඒ තාරකාවට යා හැක
හිතා ගන්නත් බැරි තරම් දුර
පා නගා..

සැමරුම්, මතක, සුන්බුන් මගැර
සීරුවෙන් ඇවිදින කල අලුත්
මං සොයා
හිතක් නැති ගිරිකුළක හිස මත
අහම්බෙන් මෙන් හැපී කැබලිව
විසිර යන අපූරුව අරා
තාරකා...

ඉතා දිග දවසක අවසන
ඉබාගාතේ යන මේ කුළක්
ඇසිල්ලක් නතරව ඇස් පියන් මත
අත තබා
බලෙන්ම නතර කරලන
ඒ දිග හැඟීමට දෙන කෙටි නම
තාරකා..



## MEANINGFUL CONVERSATIONS AND... IDLE PRATTLE (SAMPAPPRALAPA).

Conversations, kindly and meaningful,
Flowing with such ge
Like cool water dabbed gently
On a fevered brow,
Lack the cutting edge
That breaks up the brittle
Bon homie
Of false conviviality
And the breathless rush
Of glib and empty mouthings,
That overreach
And exhaust,
In the total unease
And the insufferable hush,
Of a charged silence.

The tinsel that hurts and offends
The eye and the mind,
Never portends serenity of any kind,
Nor would the hollow voice that brings
Little solace or joy,
Do much else
Than bruise the silence,
With the grating,
Unresonant ring,
Of a cracked bell!

**Chandra Wickramasinghe**
Colombo

# පහන් වැට

## නැකත ඒනකං

## බී.ජී.එම්. ජනප්‍රිය



අහල තිබුණා ඔබ
කොහොමද දැනෙන්නෙ කියලා
ඔබ අලුතින් ම ලිව්ව කවිය

අහන්නෙපා අයෙ
කොහොමද දැනුනෙ ඒ කවිය මට
යාලු කම් හින්දම
වහා වැටහෙන හැඟීම්වලට පැටලෙන කවිය...

මගෙම හැඟීම්වලින් හෙම්බත් වෙන මගේ හිත
කවිය උඩ පොරකන විදිය ඒත්තු ගන්නන්න
ගොඩක් කල් යාවි නේද මට

කැම්පස් එකේ හුඟක් අය ගෙදර ගිය දවස්වල
කැන්ටිමේ මේසවල දුක සැප අහන අපි
හුවමාරු කරගත්ත නේද හුඟක් දේවල්
අපිට දැනෙන හැටි

ඒ වගේ දවසක් ආයෙ ආවොත්
එහෙමත් නැත්තම්
අද යකඩ වගේ දැනෙන දේවල්වල බර
කාලයෙන් හේදිලා ගිය දවසක
පුළුං රැල්ලක් වගේ අතින් අත යව යව
උඩ දමල කටින් පිඹ පිඹ
පා කරමු කවිය ගැන මතකය

එහෙම දවසක් ආවාම
කියන්නට ඇහැක් වෙයි
මේ කවිය මට දැනෙන හැටි

## නුදුරු

දිගු සීත කාලෙක
මතකය දෑත ගුලිකර
ලා දළු හෙමින් නැගිටියි
හෙටක රහසක් අරගෙන

පිසිමින් අලුත් මල් හැම
හැමූ තෙතබරි සුළඟක
සැඟවුණත් සුසුවඳ
මල්ම පූදී තව තව
..............................

## මුතු හදම්

අතැර ගිය වැලි අහුරකින්
කැවේ සිත යට සියුම් තැන්
දුක දරා සුපුරුදු බැවින්
මුතු හදම් මම වැලි අරන්

යළිත් නුඹ ආවිට ඉතින්
මුතු තබම් අත්ලත පෙමින්
හැරූ බව වත් නොම දැනන්
සිනාසෙනු ඇත නුඹ නිතින්

**මලිති විජේසේකර**




## පරණ අවුරුද්ද

## මාලතී කල්පනා ඇම්බ්‍රෝස්

ඉතිං අපි බැස ආමු හූ කියන දුම්රියෙන්
සිතින් සිත වැළඳ ගත් නොහිම් වූ ප්‍රේමයෙන්
නිතින් රතු වී යළිත් දියව යන වේගයෙන්
අතින් හිරු අඳින සිතුවම සිඹිමු ලෝභයෙන්

එතැන මඳ නලක් විය නතර වී දුක කියන
එතැන රළ පෙළක් විය හැපි හැපී ඉකි බිඳින
එතැන වුව දහක් දන සිනා මුව පැළඳගෙන
එතැන වූ වැලි තරම් දුක් දුටිමු ඇස් කොණින

දුබල ඔරුබඳ වැටී වෙරළ මත කවි ලියන
සසල සමුදුරු ළඳට දුර ඉඳන් පෙම් කරන
ඉහළ පහළට දුවන සරුංගල් මග කැඩෙන
විසුල සිතුවිලි මැදට කඩල ගොටු දිග හැරෙන

අසුරු ගසනා සැනින් විසල් අහසට නැගෙන
සයුරු ඉම පරදවා ගොසින් ලෝකය දකින
සොයුරු සියොතුනි උඩ නැගී කරණම් ගසන
කවුරුහරි දුටුවාද මී විතට පෙම් කරන

තටු නැතත් නුබ නැගෙන විහඟෙක් ය සුමුදුරත්
පටුනකින් ණයට ගත් අකුරක් ය කාලයත්
නටුවකට මලක් වී පිපෙන්නේ හීනයක්
පිටුවකින් ලියනු බැරි පුවතක් ය ප්‍රේමයත්

ඉර බලයි හැරී සිය පිළිබිඹුව දිය මතින්
වර නැගෙයි මතක රළ කළඹවයි මදහසින්
සරතැස ට ඉඩ නො දී ජීවිතය ගෙන මිටින්
උර හොවා ඔබ සිඹිමි යළි සිඹිමි සෙනෙහසින්

# මාලිනිය



වුණෝ මේ දෙය දෙවසකට පෙර අදහගන්නට බැරි තරම්
සයනෙ සැතපී ගිලන් වූ කය තබාගෙන තම සිත කෙළින්
පෙනේ අද මෙන් එදා සිටියුරු රැස්ව සිටි අප සනසමින්
අනේ අද ඔබ නැතිවූ පාළුව පෙනේ දස අත බැලූ ගමන්

*දෙවසරකට පෙර අප අතරින් වෙන්වූ*
*මාලිනී ජයසිංහ සදා සිහිපත් කරමු*

රෝහණ කරුණාරත්න